**ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකය - අගෝස්තු 2022**

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්**

## හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකයේ (අදියර 3) සොයාගැනීම් පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසින් මෙම වාර්තාව සකස් කර ඇත. ශ්‍රී ලංකාව මුහුණ දී සිටින ආර්ථික හා දේශපාලන අර්බුදය හමුවේ, මෙම මත විමසුම සැලසුම් කර ඇත්තේ මහජන අත්දැකීම්, අරගලය පිළිබඳ ඔවුන්ගේ මතය සහ වර්තමාන ආර්ථික දේශපාලනික අර්බුධයේ විවිධ පැතිකඩ පිළිබඳ මහජන මතය ග්‍රහණය කර ගැනීමේ අරමුණින් ය. ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික අස්ථාවරත්වය හමුවේ, SI හි දිවයින පුරා ක්ෂේත්‍ර ජාලය භාවිතයට ගනිමින් ඉතා කෙටි කාලයක් තුළ මෙම සමීක්ෂණය කිරීමට සිදු විය.

## ක්‍රමවේදය

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ විශ්වාසනීයත්ව දර්ශකයහි තුන්වන අදියර සඳහා ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතර නියෝජනය වන පරිදි (සිංහල, දෙමළ, උඩරට දෙමළ සහ මුස්ලිම්) 1100ක පිරිසකින් යුතු නියැදියක් සඳහා අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලදී. තවද, මෙම නියැදිය දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල පුරුෂයන් සහ ස්ත්‍රීන්ගෙන් සමන්විත වේ. මෙහිදී ප්‍රතිචාර දැක්වූවන් 1100 දෙනා අහඹු නියදි තාක්ෂණය භාවිතයෙන් තෝරා ගන්නා ලද අතර නියැදි ස්ථාන තෝරා ගැනීම සඳහා බහුඅදියර අහඹු ස්ථර නියැදි ක්‍රමයක් භාවිතා කරන ලදී. මෙම ජාතික මත විමසීම සඳහා ක්ෂේත්‍ර කටයුතු 2022 අගෝස්තු පළමුවැනිදා සිට පස්වැනිදා දක්වා පවත්වන ලදී. එහිදී දත්ත, ජනගහනයේ සැබෑ දිස්ත්‍රික්ක සහ ජනවාර්ගික අනුපාතය පිළිඹිබු කිරීම සඳහා බර තබා ඇත. මෙහි දත්ත සමාජ විද්‍යාවන් සඳහා භාවිතා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතා කරමින් විශ්ලේෂණය කර ඇත.

## සොයාගැනීම්

### *වත්මන් ආර්ථික අර්බුදයේ මහජන අත්දැකීම්*

ශ්‍රී ලාංකිකයන්ගෙන් අති බහුතරයක් පවසන්නේ තමන් ආර්ථික දුෂ්කරතා අත්විඳින බවයි. මෙහිදී 80% ක් පමණ ප්‍රකාශ කරන්නේ තම ආදායම තම අවශ්‍යතා සම්පූර්ණ නොකරන බවයි. මෙම 80%න් අඩක් දැඩි දුෂ්කරතා අත්විඳියි. නාගරික ප්‍රදේශවල ජීවත් වන අයට වඩා ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව දැඩි දුෂ්කරතා අත්විඳියි.

වත්මන් ආර්ථික අර්බුදය ඔවුන්ගේ ජීවිතවලට බලපා ඇති ආකාරය මෙම සමීක්ෂණයෙන් විමසා බලන ලදී. 87% වැඩි වූ ගෘහස්ථ වියදම් දැරීමට අපහසු බව පවසන අතර 83% පවසන්නේ තමන් මිලදී ගැනීමට හුරු වී සිටි ආහාර ද්‍රව්‍ය තවදුරටත් මිලදී නොගන්නා බවයි. තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක්

පවසන්නේ තම ඖෂධ ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවයි. 42% ක් පවසන්නේ ඔවුන් දිනකට ගන්නා ආහාරවේල් ප්‍රමාණය හෝ ලබාගන්නා වේල් ගණන අඩු කර ඇති බවයි. වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් තම නිවසේ එක් අයෙකුට හෝ රැකියාව අහිමි වී ඇති බව තුනෙන් එකකට මඳක් වැඩි ප්‍රමාණයක් ප්‍රකාශ කරයි. මෙම දුෂ්කරතා සෑම ප්‍රදේශයකම දක්නට ලැබේ. කෙසේ වෙතත්, සොයාගැනීම්වලින් පෙනී යන්නේ මෙහි බලපෑම ග්‍රාමීය ප්‍රජාවන් තුළ තරමක් ඉහළ මට්ටමක පවතින බවයි. ආහාර පරිභෝජනය සම්බන්ධයෙන් ගත් කල, ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම මහ නගර සහ බල ප්‍රදේශ වල ජීවත්වන ජනතාව ද එක හා සමානව දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දී සිටියි.




***ජාතික මට්ටමේ නායකයින් පවතින ආර්ථික අර්බුදය විසඳීම සඳහා නිවැරදි තීරණගැනීම කෙරෙහි විශ්වාසය***

පවතින ආර්ථික අර්බුදය විසඳීම සඳහා ජාතික නායකයින් නිවැරදි තීරණ ගනීදැයි යන්න පිළිබඳ ජනතාව කොතෙක්දුරට විශ්වාස කරනවාදැයි විමසූ විට, ඔවුන් අනුර කුමාර දිසානායක කෙරෙහි ඉහළම විශ්වාසයක් දක්වා ඇති අතර ඉන්පසුව රනිල් වික්‍රමසිංහ සහ සජිත් ප්‍රේමදාස කෙරෙහිත් විශ්වාසය දක්වා ඇත. සෑම ජනවාර්ගික ප්‍රජාවක්ම, අනුර කුමාර දිසානායක කෙරෙහි එක හා සමානව විශ්වාස තබා ඇත. දෙමළ සහ උඩරට දෙමළ ප්‍රජාවන් සිංහල හා මුස්ලිම් ප්‍රජාවට වඩා රනිල් වික්‍රමසිංහ කෙරෙහි විශ්වාසය තබා ඇත. කෙසේ වෙතත්, පවතින ආර්ථික අර්බුදය විසඳීම සඳහා රනිල් වික්‍රමසිංහ නිවැරදි තීරණ ගනු ඇතැයි තමන් විශ්වාස කරන බව සිංහල ප්‍රජාවගෙන් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රකාශ කරයි. සුළුතර ප්‍රජාවන් සජිත් ප්‍රේමදාස මහතා කෙරෙහි සිංහල ප්‍රජාවට වඩා සැලකිය යුතු ප්‍රමාණයකට ඉහළ විශ්වාසයක් තබා ඇත. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නිල වශයෙන් නියෝජනය කරන නායකයින් වන මහින්ද රාජපක්ෂ, ඩලස් අලහප්පෙරුම සහ දිනේෂ් ගුණවර්ධන යන අයට සියලු ජනවර්ග තුළින් ලැබෙන්නේ අඩු විශ්වාසයකි. ඒ අතරින් වත්මන් ආර්ථික අර්බුදය විසඳා ගැනීම සඳහා නිවැරදි තීරණගත හැකියැයි අවම විශ්වාසයක් ඇති නායකයා මහින්ද රාජපක්ෂ බව සමීක්ෂණ සොයාගැනීම්වලින් පෙනී යයි. වත්මන් ආර්ථික අර්බුදය විසඳීමට ක්‍රියා කිරීම කෙරෙහි අනුර කුමාර දිසානායක සහ රනිල් වික්‍රමසිංහ ග්‍රාමීය සහ නාගරික ප්‍රජාවගේ විශ්වාසය හිමි කරගනිද්දී ග්‍රාමීය ප්‍රජාවට සාපේක්ෂව, පවතින ආර්ථික අර්බුධය සඳහා සජිත් ප්‍රේමදාස කෙරෙහි නාගරික ශ්‍රී ලාංකිකයන් වැඩි විශ්වාසයක් පළ කර ඇත.



*ගෝඨාගෝගම අරගලය මෙහෙයවූ තරුණ තරුණියන් පිළිබඳ මහජන මතය*




මෙම සමීක්ෂණයෙන් ගෝඨාගෝගම අරගලය මෙහෙය වූ තරුණ තරුණියන් පිළිබඳ පවතින මහජන මතය කෙරෙහි අවධානය යොමු කරන ලදි. වඩා හොඳ ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා රට ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණින් අරගලය, සක්‍රීය පුරවැසියන් ලෙස ක්‍රියාකරන තරුණ තරුණියන් විසින් මෙහෙයවනු ලබන බව 84% ක් එකඟ වේ. මෙහිදී අරගලයට සම්බන්ධ තරුණ තරුණියන් ප්‍රචණ්ඩකාරී කණ්ඩායම්වලට සම්බන්ධ බවට 82%ක් එකඟ නොවන අතරම අරගලය මෙහෙයවන්නේ දේශපාලන දැනුමක් නැති මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිසක් බව 88% එකඟ නොවෙති. සියලුම ශ්‍රි ලාංකික ජනවාර්ගික ප්‍රජාවන් අරගලයට සම්බන්ධ තරුණ තරුණියන් පිළිබඳව අතිබහුතරයක් ධනාත්මක අදහස් ප්‍රකාශ කරයි. ඍණාත්මක මතය පැන නගින්නේ රටේ සුළුතරයකින් වුවද, එම ඍණාත්මක මතය බොහෝ දුරට සිංහල ප්‍රජාව අතර මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව අතරින් මතු වී ඇත.

*විරෝධතාකරුවන් ජනාධිපති ලේකම් කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් කිරීම පිළිබඳ මහජන මතය.*

රජය විසින් අරගලකරුවන් ජනාධිපති ලේකම් කාර්යාල පරිශ්‍රයෙන් ඉවත් කළ ආකාරය 66% අනුමත නොකරති.

*හදිසි නීතිය පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම පිළිබඳ මහජන මතය.*

2022 ජූලි 27 වැනි දින පාර්ලිමේන්තුව විසින් හදිසි නීතිය සම්මත කිරීම 65% අනුමත නොකරයි. කෙසේ වෙතත්, සිංහල ප්‍රජාවෙන් 28% ක් සහ දෙමළ ප්‍රජාවෙන් හතරෙන් එකක් මෙය අනුමත කරයි.

*විරෝධතාකරුවන් වත්මන් රජයට ඉදිරිපත් කළ යෝජනා පිළිබඳ මහජන මතය*

විරෝධතාකරුවන් වත්මන් රජයට ඉදිරිපත් කර ඇති යෝජනා සම්බන්ධයෙන් මහජන එකඟවීම සහ එකඟ නොවීම පිළිබඳව මෙම සමීක්ෂණයෙන් විමසන ලදී. ඒ අනුව අති බහුතරයක් සියලුම යෝජනා සඳහා සහය දක්වයි. සියලුම ප්‍රතිචාරකයන් විශ්වාස කරන්නේ දේශපාලනඥයන් විගණනය කළ යුතු අතර ඔවුන්ගේ විගණනය කළ නොහැකි ධනය රජය විසින් රාජසන්තක කළ යුතු බවයි. සෑම දසදෙනෙකුගෙන්ම නවදෙනෙකුම සිතන්නේ මහ මැතිවරණය කඩිනමින් පැවැත්විය යුතු බවයි. එසේම 20 වැනි සංශෝධනය අහෝසි කර 19 වැනි සංශෝධනයට සමාන සංශෝධනයක් ගෙන ආ යුතු බව 87% ගේ අදහස වේ. රටේ පවතින අර්බුදයෙන් ගොඩ එනතුරු පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ වලින් සමන්විත අන්තර්වාර ආණ්ඩුවක් ස්ථාපිත කළ යුතු බව 80% ට වැඩි ප්‍රමාණයක් විශ්වාස කරනු ලබයි. එසේම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු බවට හතරෙන් තුනකට වැඩි පිරිසක් එකඟ වෙයි.

කෙසේවෙතත්, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා සිංහල ප්‍රජාවගෙන් මෙන්ම මහ නගර සභා බල ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාවගෙන් ලැබෙන සහයෝගය තරමක් අඩු බව දැකිය හැකිය.




### *ජාත්‍යන්තර ප්‍රජාව පිළිබඳ මහජන මතය*

මෙම සමීක්ෂණය මගින් ජාත්‍යන්තර ප්‍රජාව කෙරෙහි මහනතාවගේ පවතින මතය පිළිබඳ අවධානය යොමු කරන ලදී. මෙහිදී වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීමට ශ්‍රී ලංකාවට සහාය වනු ඇතැයි ඔවුන් සිතන රට සඳහන් කරන ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව වත්මන් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට ශ්‍රී ලංකාවට සහය වන සුදුසුම රට ලෙස හතරෙන් එකක් චීනය ශ්‍රේණිගත කරන අතරම පහෙන් එකකට ආසන්න ප්‍රමාණයක් මෙම ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ශ්‍රී ලංකාවට වඩාත්ම සහාය දෙනු ඇතැයි විශ්වාස කරන රටවල් ලෙස ඇමරිකා එක්සත් ජනපදය සහ ඉන්දියාව ශ්‍රේණිගත කරයි. මෙහිදී චීනය පිළිබඳ තරමක් ඉහළ විශ්වාසයක් තිබුණද, ශ්‍රී ලංකාවට වැඩිපුරම සහය ලබා දෙන්නේ කුමන රටද යන්න පිළිබඳව සිංහල ප්‍රජාව තුළ ඇත්තේ මිශ්‍ර මතයකි. සුළුතර ප්‍රජාව විශ්වාස කරන්නේ පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට ශ්‍රී ලංකාවට සහය දක්වන සුදුසුම රට ඉන්දියාව වනු ඇති බවයි.

### *පුළුල්ව පැතිරුනු අශුභවාදය*

රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සම්බන්ධයෙන් ජනතාව කෙතරම් සුබවාදී ද (හෝ නැති ද) යන්න මෙම සමීක්ෂණයෙන් විමසන ලදී. මෙහිදී සොයාගැනීම්වලින් පෙනී යන්නේ රටේ ආර්ථික අනාගතය පිළිබඳව ජනතාව අතිශයින්ම අශුභවාදී බවයි. 58% ක් වර්තමානයේ පවතින පසුගාමී තත්වය යථාතත්වයට පත්වීමට බොහෝ කාලයක් ගතවනු ඇතැයි සිතන අතර 20% ක් පවසන්නේ ඔවුන්ට ඒ පිළිබඳව විශ්වාසයක් නැති බවයි. මෙම ආන්තික අශුභවාදය සියලු ජනවාර්ගික කණ්ඩායම් තුළ මෙන්ම නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන් තුළ ද දැකිය හැකිය.

**අවසානය**